**පස්ගොඩ ප්‍රාදේශීය සභාව**

**මාතර දිස්ත්‍රික්කය**

**------------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 19 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 23 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) වැඩ අවසන් කර තිබූ කර්මාන්ත 05 කට අදාළ ණයගැති සහ ණයහිමි ශේෂ රු.136,758 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ඇහැලකන්ද ඉහලගොඩ මාර්ගය සකස් කිරීම වෙනුවෙන් 2015 වර්ෂයේ ලැබී තිබූ රු.500,000 ක මුදල තවදුරටත් හිඟ හිටි ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.83,000 ක් වටිනා පරිගණක හා උපාංගවල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) කර්මාන්ත 02 ක් වෙනුවෙන් ලැබී තිබූ, රු.1,992,750 ක අත්තිකාරම් මුදලින් එම කර්මාන්ත ඉටුකිරීම ආරම්භ කර නොතිබුණු නමුත්, වර්ෂයේ වියදම්වලට ඇතුළත් කර තිබුණි.

(ඉ) ඌරුබොක්ක වෙළඳ සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.8,169,257 ක එක්වන් මුදල ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.17,107,635 ක් වූ හිඟ හිටි වෙනත් ආදායම් ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.1,760,880 ක ශේෂ 07 ක් ඇතුළත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.22,449,864 ක් වූ වියදම් ණයහිමි ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු. 390,000 ක ශේෂ 03 ක් ඇතුළත් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසානයට වසර 03 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.821,257 ක ගෙවිය යුතු තැන්පත් ශේෂ 04 ක් පැවතියද, ඒවා නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතුව තිබුණු රු.1,758,665 ක මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

එකතුව රු.26,936,017 ක් වූ ස්ථාවර වත්කම් ශේෂ 03 ක් සම්බන්ධයෙන් යාවත්කාලීන හා විධිමත්ව පවත්වන ලද, ස්ථාවර වත්කම් ලේඛනය, හිමිකම් ඔප්පු සහ ඉන්වෙන්ට්‍රි ලේඛන යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා එම ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 පරිදි වර්ෂ 02 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.553,450 ක් වූ ගෙවිය යුතු තැන්පතු ශේෂ 29 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

## 02. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.12,188,452 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.9,268,647 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,919,805 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 72 ක් තරම් මුළු පුනරාවර්තන වියදම් පැවති බව නිරීක්ෂණය විය.

(ආ) සභාවේ ස්වයං උත්පාදිත ආදායම ඉක්මවා වර්ෂ දෙකෙහි සැලකිය යුතු ඉහළ අගයන්ගෙන් පුනරාවර්තන වියදම් වැඩිවී ඇති බව නිරීක්ෂණය වූ අතර ආදායම් ආධාර නොලැබෙන්නට, සභාවේ ස්වයං උත්පාදිත ආදායම් මගින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිඳු ආකාරයකින් හැකියාවක් නොලැබෙන බව පෙන්නුම් කෙරේ.

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

------------------------------------

සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික අනුපාතය 1: 1.7 ක් ලෙස දැක්වුණද, ණයගැති ශේෂය තුළ වසර 03 ක කාලයක් ඉක්මවා අයනොවී පවතින රු.1,760,880 ක ශේෂ පැවතීමෙන් එම අනුපාතයන් ප්‍රකාරව ද්‍රවශීලතා තත්ත්වයක් නොපවතින බව නිරීක්ෂණය විය.

### 2.4 ආදායම් පරිපාලනය

------------------------

#### 2.4.1 අක්කර බදු

-----------

ආරම්භක හිඟ ශේෂය රු.97,654 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.35,267 ක් සමඟ රු.132,921 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.39,341 ක් වීමෙන්, වර්ෂය අවසානයට රු.93,580 ක හිඟ ශේෂයක් පැවතුණි.

**2.4.2 කඩකාමර කුලී**

-----------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ආරම්භක හිඟ ශේෂය රු.2,252,215 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.1,598,500 ක් සමඟ රු.3,850,715 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.651,520 ක් වීමෙන්, වර්ෂය අවසානයට රු.3,199,195 ක හිඟ ශේෂයක් පැවතුණි.

(ආ) 2014 වර්ෂයේ තක්සේරුවෙන් පසු ඌරුබොක්ක වෙළඳ සංකීර්ණයේ හා වීනස් ක්‍රීඩාංගනය අසළ කඩකාමරවල හිඟ කඩකුලී ශේෂය රු. 2,285,470 කින් වැඩි වී තිබුණි. ඉන් කඩකාමර 35 ක ගිවිසුම්, 2014 දෙසැම්බර් 31 දිනෙන් පසු අලුත් නොකිරීම නිසා හිඟ කුලී අයකර ගැනීම සඳහා නීත්‍යානුකූලව කටයුතුකළ නොහැකි තත්ත්වයක් උද්ගතවී පැවතුණි.

**2.4.3 පොළ බදු**

----------

වර්ෂය ආරම්භයට වූ රු.136,862 ක හිඟය සහ රු.5,731,700 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සමඟ රු.5,868,562 ක් වූ අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.5,725,030 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.143,532 ක හිඟ ශේෂයක් පැවතුණි.

**2.4.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.1,027,138 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.11,810,440 ක් ලැබිය යුතුව තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්ය සාධනය**

------------------

**3.1.1 ප්‍රාග්ධන වැඩ යෝජනා ඉටුකිරීමේ ප්‍රගතිය**

---------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම් රු.38,490,000 ක් වූ නමුත්, තථ්‍ය ප්‍රාග්ධන වියදම් රු.26,499,518 ක් වීමෙන් ප්‍රාග්ධන වියදම් වල ප්‍රගතිය සියයට 69 ක් විය.

## 3.2 කළමනාකරණ අකාර්යක්‍ෂමතා

---

සභාව සතු ඉඩම් 23 ක මැනීම් කටයුතු සඳහා රු.1,201,550 ක වියදම් දරා තිබුණද, එම ඉඩම් ආරක්‍ෂාකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

### 3.2.1 මානව සම්පත් කළමනාකරණය

---

සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තෘතියික, ද්විතියික මට්ටමේ තනතුරු 02 ක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 ක පැවති පුරප්පාඩු පුරවා ගැනීමට හා තනතුරු 04 ක පවතින අතිරික්ත තනතුරු 07 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.2.2 සේවක ණය

---

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතුව තිබුණු හිඟ ණයශේෂ වල එකතුව රු.2,819,345 ක් විය.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

පහත දැක්වෙන කරුණු නිරීක්‍ෂණය විය.

(අ) ඌරුබොක්ක බස්නැවතුම් පොළේ කඩ කාමර 40 ක් පෙර විකුණුම් මත බෙදා දීම සඳහා 2012 වර්ෂයේදී ටෙන්ඩර් කැඳවා තිබූ අතර, එහිදී 11 දෙනෙකු පමණක් ගිවිසුම් අත්සන් කර තිබුණි. ගිවිසුම් වලට අනුව කටයුතු නොකිරීම හේතුවෙන් ගිවිසුම් අවලංගු වී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු එක්වන් මුදලින් 2016 දෙසැම්බර් 31 දිනට රු.8,169,257ක මුදලක් හිඟව පැවතුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට රු. 27,429,070 ක වියදම් දරා කඩකාමර 15 ක් ඉදිකර තිබුණද, ඉන් කඩකාමර 11 ක් 2016 මාර්තු 11 දින සිට නිෂ්ක්‍රීය තත්ත්වයේ පැවතුණි.

## 3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---

සභාව සතු පිරිවැය රු.7,750,000 ක් වූ බැකෝ ලෝඩරය 2015 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවති අතර, පිරිවැය රු.18,765,944 ක් වූ තවත් වත්කම් 05 ක් ඌන උපයෝජිතව පැවතුණි.

## 3.5 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

---

ප්‍රධාන කාර්යාලයේ බුදු මැදුර ඉදිකිරීම වෙනුවෙන් රු.200,000 ක ණයහිමි ප්‍රතිපාදන ඇතිකර තිබුණද, වර්ෂය තුළ අදාළ කර්මාන්තය ආරම්භකර නොතිබුණි.

### 3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ කසළ එකතු කිරීම වෙනුවෙන් වැටුප් හා දීමනා, ඉන්ධන සහ වාහන අලුත්වැඩියාව වෙනුවෙන් රු.3,376,686 ක වියදම් දරා කසළ කිලෝග්‍රෑම් 157,138 ක් එකතුකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ රු.818,999 ක වියදම් දරා කාබනික පොහොර කිලෝග්‍රෑම් 17,779 ක් නිෂ්පාදනය කර තිබුණි.

(ඇ) කාබනික පොහොර නිෂ්පාදනයට යොදා නොගන්නා අපද්‍රව්‍ය සභාවට අයිතිය පවරා නොගත් බොරලම්පොත ඉඩමකට බැහැර කරන අතර, එම ඉඩම සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

### 3.7 පාරිසරික බලපෑම
-------------------

2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය මගින් කර්මාන්ත 25 ක් සඳහා ප්‍රාදේශීය සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදිය යුතු බව දන්වා තිබුණි. ව්‍යාපාර බදු ගෙවන කර්මාන්තවලට අයත් ව්‍යාපාර 94 න් 77 ක් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගැනීම නිසා සභාවට රු. 338,800 ක ආදායම් අහිමි වී තිබුණි.

## 04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
---------------------------------------

### 4.1 අයවැය පාලනය
-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. වැය විෂයයන් 08 ක එකතුව රු.9,277,101 ක් වූ ඉතිරිවීම්ද, ආදායම් විෂයන් 03 ක ළඟාකර නොගත් ඉලක්කයන්ගේ එකතුව රු.9,260,351 ක් දක්වා පැවතීම හා හේතු නිසා.

**4.2** **අභ්‍යන්තර විගණනය**

-------------------------

ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත් පාළන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/ යහ/01/ න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබූ නමුත්, සභාව විසින් පත් කර තිබූ අභ්‍යන්තර විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු.442,448 ක මුදලක් ගෙවා තිබුණි.

**4.3** **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

---------------------------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනයන්**

------------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) අදහස් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය